විශ්‍රාම වැටුප් චක්‍රලේඛ: 03/2015 (සංශෝධන VIII)

මගේ අංකය : විවැ/චක්‍රලේඛ/2022
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,
මාළිගාවත්ත,
කොළඹ 10.
2022.10.07

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිස්ත්‍රික් ලේකම්වරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන්,

**<u>විශ්‍රාම වැටුප් ලබන දිනටම විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ලබා දීම</u>**

2015.04.24 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 03/2015, එහි සංශෝධන හා 2015.12.29 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ ලිපි 08/2015 හා බැඳේ.

02. එකී චක්‍රලේඛ උපදෙස් පරිදි විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි ක්‍රියාත්මක කරන විශ්‍රාම වැටුප සක්‍රීය කිරීමේ සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම (සත්කාර පියස) ඊට අමතරව 2022.10.08 දින සිට පහත දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන්හි පිහිටි කාර්යාලයන්ට ද විමධ්‍යගත කරනු ලැබේ.

I. මාතර
II. නුවර
III. කුරුණෑගල
IV. අනුරාධපුර
V. බදුල්ල

03. ඒ අනුව විශ්‍රාම වැටුප් අයදුම්පත්(PD 03) යොමු කිරීමේ දී විශ්‍රාමිකයාට සිය පහසුව අනුව මධ්‍යස්ථානයක් තෝරා ගැනීමට අවස්ථාව සැලසේ (ඇමුණුම 01). සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණීමට නියමිත දිනය සහ වේලාව කෙටි පණිවුඩයක් මගින් විශ්‍රාමිකයාට සෘජුවම දැනුම් දෙනු ලැබේ.

**ඒ.ජගත් ඩී.ඩයස්**
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් :-

| | | |
|---|---|---|
| 1. | ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | - කාරුණික දැන ගැනීම සඳහා |
| 2. | විගණකාධිපති | - කාරුණික දැන ගැනීම සඳහා |

## <u>විශ්‍රාම වැටුප් සක්‍රිය කිරීමේ සම්මුඛ පරීක්ෂණ මධ්‍යස්ථානය තෝරා ගැනීම</u>

විශ්‍රාම වැටුප් සක්‍රිය කිරීමේ සම්මුඛ පරීක්ෂණය දිස්ත්‍රික් මට්ටම වෙත විමධ්‍යගත කිරීම යටතේ PD3 මාර්ගගත පද්ධතිය සංශෝධනය කර ඇත.

(1) විෂයභාර නිලධාරීන් විසින් මාර්ගගත ක්‍රමය ඔස්සේ PD3 අයදුම්පත් යොමු කිරීමේ දී Personal Information යටතේ Interview Center/ සම්මුඛ පරීක්ෂණ මධ්‍යස්ථානය තෝරා ගැනීම සඳහා Head office හෝ සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම සඳහා යෝජිත දිස්ත්‍රික් ලේකම් කාර්යාල ලැයිස්තුවක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව විශ්‍රාමිකයාට සම්මුඛ පරීක්ෂණයට සහභාගි වීමට අවශ්‍ය මධ්‍යස්ථානය එම ලැයිස්තුව මඟින් නිවැරදිව තෝරා ගත යුතුය.

